www.agaram.lk

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

| 09 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | 2 ඒකකය |
|---|---|---|

## කාලීන වෙනස්වීම්

### I කොටස

- **ප්‍රශ්න අංක 1-5 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

01. ''තම කටයුතු වඩා පහසු කර ගැනීමට මිනිසා යොදා ගන්නා ක්‍රමවේදය තාක්ෂණයයි.'' ( )
02. ගවේෂණ හා පර්යේෂණ මගින් සිදු කරන නව සොයා ගැනීම් සමාජ පිරිහීමට හේතු වී ඇත. ( )
03. තාක්ෂණික මෙවලම් සමාජයට වැඩදායක ලෙස යොදා ගැනීම කළ යුතුය. ( )
04. ජනගහනයේ ක්‍රමික වර්ධනයත් සමඟ මිනිස් අවශ්‍යතා ද වර්ධනය විය. ( )
05. තිරසර සංවර්ධනය යනු තාවකාලික දරාගත නොහැකි සංවර්ධනයයි. ( )

- **ප්‍රශ්න අංක 6-10 දක්වා දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

06. ''අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී'' මෙම ප්‍රකාශය කාගේ ද?
    (1). කුමාරතුංග මුනිදාස මහතාගේ (3). මහත්මා ගාන්ධිතුමාගේ
    (2). අනගාරික ධර්මපාලතුමාගේ (4). ඒබ්‍රහම් ලින්කන් මහතාගේ

07. ලංකාවේ පළමු සමූපකාර සමිතිය ආරම්භ කරන ලද්දේ,
    (1). 1905 දී රත්නපුරයේ දී (3). 1906 දී තෙල්දෙණියේ දී
    (2). 1845 දී තලවකැලේ දී (4). 1910 දී දුම්බර දී

08. නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා දක්වා ලබා දීමේ ක්‍රියාවලිය,
    (1). පරිභෝජනය යි (3). නිෂ්පාදනය යි
    (2). බෙදාහැරීම යි (4). ආයෝජනය යි

09. එකිනෙකාට උදව් කරගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම.
    (1). සහජීවනය යි (3). ගෝලීයකරණය යි
    (2). යහජීවනය යි (4). අන්‍යෝන්‍ය රැඳියාව යි

10. පහත ගුණාංග අතරින් සහජීවන ගුණාංගයක් නොවන්නේ,
    (1). සුබවාදී වීම (3). බෙදාහදා ගැනීම
    (2). අවංක බව (4). කඩිසර බව

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

- **පහත 11-15 දක්වා අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.**

11. කෘෂිකාර්මික කටයුතුවලදී වගාවන් සඳහා ජලය සම්පාදනය කිරීමේ දී නවීන තාක්ෂණය භාවිත කර ගන්නා අවස්ථාවක් ලියන්න. ....................................................................................................
12. යහජීවන ගුණාංග ඇතුළත් දමිළ සාහිත්‍යයේ එන වල්ලුවර්තුමා ගේ කෘතිය කුමක්ද? ..........................................................................................
13. හිස නමා ආචාර කිරීම, කිමෝනාව ඇඳීම, සුමෝ ක්‍රීඩාව, මළවුන් ඇදහීම යන සංස්කෘතිකාංග සහිත රට කුමක්ද? ..........................................................................................
14. ඉන්දියානු වැසියෝ දේශීය නිෂ්පාදන භාවිතයට නැඹුරු කර වූ ඉන්දීය නායකයෙක් නම් කරන්න. ..........................................................................................
15. සමූපකාර ව්‍යාපාරයේ පියා ලෙස සැලකෙන්නේ කවුද? ..........................................................................................

- **අංක 16-20 දක්වා දී ඇති හිස්තැන සඳහා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

16. ආර්ථිකයක පවත්නා සම්පත් මිනිස් වුවමනා ඉටු කරගත හැකි ආකාරයට වෙනස් කිරීම ............................................................ නම් වේ.
17. ඉස්සර කාලෙ ගමේ ළමයි අධ්‍යාපනය ලැබුවේ ගමේ සිටි උගත් වැඩිහිටි අයගේ ගෙදරින් එය හැඳින්වුණේ ............................................................ කියල.
18. පන්සල හා පිරිවෙන ආශ්‍රිතව අධ්‍යාපනය ලබාදුන්නා. ඒ කාලෙ ............................................................ ලිවීම බහුලව භාවිතා කළා.
19. ආර්ථිකයක නිෂ්පාදනය කරන භාණ්ඩ හා සේවා යොදා ගෙන මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරගැනීම ............................................................ යයි.
20. එකට ජීවත් වෙමින් එකිනෙකාට උදව් කර ගනිමින් සහයෝගයෙන් කටයුතු කිරීම ................................. යි.

**(ජන සහයෝගය, නිෂ්පාදනය, වැලිපිල්ලේ, යහජීවනය, ගුරු ගෙදර,**
**සහජීවනය, බෙදාහැරීම, පරිභෝජනය)**

(20 × 02 = 40)

## <u>II කොටස</u>

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.**

01. (1). තාක්ෂණික වෙනස්කම් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.01)
    (2). යෝග්‍ය තාක්‍ෂණය යන්න සරලව හඳුන්වන්න. (ල.02)
    (3). තිරසර සංවර්ධනය ඇති කර ගැනීමට යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් අයත්වන ප්‍රතිලාභ 4ක් සඳහන් කරන්න. (ල.04)
    (4). කෘෂි කාර්මික ක්ෂේත්‍රයට නවීන තාක්‍ෂණය යොදා ගැනීමෙන් එම අංශයේ ඇතිවී තිබෙන සංවර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk


agaram.lk

02. (1). ''වැඩ ලෝකය'' ලෙස හැඳින්වෙන්නේ කුමක්ද? (ල.01)

(2). වැඩ ලෝකයේ රැකියා අවස්ථා සඳහා පවත්නා ඉල්ලුම හා සැපයුම සරලව අර්ථකථනය කරන්න. (ල.02)

(3). තාක්‍ෂණයේ දියුණුවත් සමඟ වර්තමාන රැකියා වෙළෙඳපොළෙහි කාර්මික අංශයේ රැකියා ක්ෂේත්‍ර 4ක් ලියන්න. (ල.04)

(4). රැකියා වෙළෙඳපොළෙහි පවතින නව ප්‍රවණතාවලට සරිලන අයුරින් සපුරා ගත යුතු සුදුසුකම් මොනවාදැයි විස්තර කරන්න. (ල.05)

03. (1). ''යහජීවනය'' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.01)

(2). ''යහජීවනයක'' අවශ්‍යතාවයට බලපාන කරුණු 2ක් ලියන්න. (ල.02)

(3). ''සහජීවන'' ගුණාංග 4ක් ලියන්න. (ල.04)

(4). සමාජ සංවර්ධනය කෙරෙහි ''සහජීවන'' හා ''යහජීවන'' ගුණාංග වැදගත් වන ආකාරය නිදසුන් දෙමින් පහදන්න. (ල.05)

04. (1). සමූපකාර ව්‍යාපාරයේ නිර්මාතෘ එම ව්‍යාපාරය පිළිබඳව ඉදිරිපත් කර ඇති නිර්වචනය කුමක්ද? (ල.01)

(2). සමූපකාර ව්‍යාපාරයේ අරමුණු 2ක් ලියන්න. (ල.02)

(3). ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සමූපකාර සමිති වර්ග 4ක් ලියන්න. (ල.04)

(4). සමූපකාර සේවාවෙන් ඉටු වන කාර්යයන් පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න. (ල.05)

05. (1). ''ලෝකය පිළිබඳ පුළුල් දැක්ම'' යන්න හඳුන්වන්න. (ල.01)

(2). ''දේශයට ආවේණික දේ'' යන්න ඔබ පැහැදිලි කරන්නේ කෙසේද? (නිදසුන් සහිතව) (ල.02)

(3). ලෝකයේ ජීවත් වන කිසිම පුද්ගලයකුට තනිව ජීවත් විය නොහැක. නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ල.04)

(4). දැනට වඳ වීමේ තර්ජනයට මුහුණ පා ඇති දේශීය ශාක හා සතුන් පිළිබඳ නිදසුන් දෙමින් පහදන්න. (ල.05)

(12 × 05 = 60)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk